# අභ්‍යවකාශ චාරිකාව



එච්.ජී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ

# අභ්‍යවකාශ චාරිකාව

එච්.ජී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ

අභ්‍යවකාශ චාරිකාව

කතෘ ප්‍රකාශනයකි

එච්.පී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

මුද්‍රිත දිනය 2023.11.06

කතෘගේ වෙනත් කෘතීන්

1. අහිංසක ලේන් පැටියා - 2019
2. සුදු පූසි - 2020
3. හිරු කුමරු යන්න ගිහින් - 2020

ISBN 978-624-206-585-4

# පිදුම

මට සිප්සතර හැදෑරීමට

ඉඩ හසර ලබාදුන් මගේ ගරු විදුහල්

මහාමායා මාතාවට,

මාගේ මේ කෘතිය

ගෞරවයෙන්

සෙනෙහසින්

පුද කරමි.

දිනේවා දිගුකල් මහාමායා මාතා.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

ඕන්න මගේ පුංචි යාළුවනේ අද මම ඔයාලව පුදුම කරවන්න ලස්සන කතන්දරයකින් , ඉමක් කොනක් නැති විශ්වයේ ලොකු සවාරියක් එක්කගෙන යාමටයි මේ සූදානම.




ඉතින් එහෙනම් පුංචි යාළුවනේ මේ විශ්වයේ සෞරග්‍රහ මණ්ඩලය. සූර්යා ගැන, සඳ, තරු, ගැන ග්‍රහලෝක ගැන දැනගන්නට යමු නේද?

එහෙනම් දැන් හැමෝම අභ්‍යාවකාශ ඇඳුම් ඇඳගමු.

අපි දැන් අපේ පුංචි රොකට් එකට නැගලා අභ්‍යවකාශ තොරතුරු දැන ගැනීමට පිටත් වෙමු.

අපි ජීවත් වන මේ විශ්වය හරිම සුන්දර ස්ථානයක් වගේම , විශ්මිත ස්ථානයක්.



මුලින්ම අපි අප ජීවත් වන මේ පෘථිවිය කියන ග්‍රහලෝකය ගැන කථා කරමු මගේ යාළුවනේ.

පෘථිවිය ගෝලාකාරයි. ඔයාල හැමෝම ඒ ගැන දන්වා නේද? මේ පාථිවිය තුළ මිනිසාට ජීවත්වීමට අවශ්‍ය වාතය, ජලය, ගස්වැල් යන සෑම දෙයක්ම තිබේ.

පෘථිවියේ මතුපිට 3/4 ප්‍රදේශයක්ම ජලයෙන් වටවෙලයි තියෙන්නේ. ඒ නිසා මිනිසාට ජීවත්වීමට ඇති හොඳම එකම ස්ථානය තමයි මේ පෘථිවිය කියන ග්‍රහ ලෝකය. අපි මේ පෘථිවිය නිල් ග්‍රහයා ලෙසද හඳුන්වනවා.



ඉතින් මේ පෘථිවිය කියන ග්‍රහ ලෝකයෙන් ඉහලට ඉහලට ම යන්න ගියාම මේ වායු ගෝලය ක්‍රම ක්‍රමයෙන් තුනී වෙලා ගිහින් වායු ගෝලය නැතිව යනවා. එතනින් එහාට කොටසක් තියෙනවා ඒකට අපි කියන්නේ අභ්‍යාවකාශය කියලයි.

ඉතින් පුංචි ඔයාලට දැන් තේරෙනවා නේ.


මේ පෘථිවියෙන් එහාට අභ්‍යාවකාශයේ තියෙන සෑම දෙයක්ම අධ්‍යනය කිරීමට තමයි මේ සූදානම. අභ්‍යාවකාශයේ තියෙන දේවල් තමයි ග්‍රහලෝක, වල්ගා තරු, තරු පොකුරු, ඉර, හඳ, මන්දාකිණි වගේ දේවල්.

මෙන්න මේ අභ්‍යාවකාශයේ තිබෙන දේවල් අධ්‍යනය කිරීම තමා තාරකා විද්‍යාව කියන්නේ.

දැන් හිතන්නකෝ ඔයාලා මෙන්න මෙහෙම.

"අහසේ කුරුල්ලෝ පියාසර කරනවා. සරුංගල් ගුවන් යානා අහසේ තිබෙනවා" නමුත් මේ අහසේ තියන දේවල් අධ්‍යනය කිරීම නෙමෙයි තාරකා විද්‍යාව කියන්නේ.

කොහොමද යාළුවනේ අපේ අභ්‍යවකාශ සවාරිය. හරිම ආසයි නේද තවත් විස්තර දැනගන්න ඔයාල. එහෙනම් දැන් අපි අපේ ලෝකයට එලිය කරන සූර්යයා (ඉර) ගැන ඉගෙන ගනිමු.



මේ සූර්යයා අපේ පෘථිවිය මෙන් 109 ගුණයක් විශාලයි. පෘථිවියට ජීවය ලබා දීමට ප්‍රධානම හේතුව තමයි සූර්යයා.

සම්පූර්ණ ග්‍රහ මණ්ඩලයේ ඇති එකම තරුව සූර්යයි.

තව දෙයක් කියන්නම් යාළුවනේ මේ සූර්යයාගෙන් නිකුත් වන ආලෝකය පොළොවට පතිත වෙන්න මිනිත්තු අටක කාලයක් ගත වෙනවා.

ඔන්න හැමෝම මේ කරුණු ටික හොඳින් මතක තියා ගන්න ඕන තේරුණා ද?.

හරි දැන් හැමෝම සඳ ගැන තොරතුරු ටිකක් දැන ගනිමු. අපේ පෘථිවියට සිටින එකම උප ග්‍රහයා තමයි චන්ද්‍රයා කියන්නේ. පෘථිවියට තාමත් නිරාවරණය වන්නේ සඳේ එක පැත්තක් පමණි. ඒ කියන්නේ සඳේ එක පැත්තක් තාමත් අඳුරු වෙලා තමයි තියෙන්නේ .



ඔයාලා දන්නවාද මීට අවුරුදු 50 කට පෙර 1972 ඇපලෝ 11 කියන යානයෙන් නීල් ආම්ස්ට්‍රෝන් කියන ගගණගාමියා ප්‍රථම වරට සඳ මත පා තැබූ බව.

ඉතින් කොහොමද අපේ අභ්‍යවකාශ සවාරිය හරිම රසවත් නේද? මගේ යාළුවනේ.

එහෙනම් දැන් අපි තාරුකා ගැන සොයා දැනගමු හොඳේ.

මේ විශ්වය තුල දිනකට 400 ක තරම් තාරුකා ප්‍රමාණයක් උපදින බව ඔබ දැන සිටියා ද ?



තාරුකා බිහිවීම සිද්ද වෙන්නේ මන්දාකිණි තුල තිබෙන නිහාරිකා තුලයි. තාරකාවක් නිර්මාණය වී අවසන් වීමට වසර බිලියනයක් පමණ කාලයක් ගතවේ.

ඔන්න දැන් ඉතින් අපේ අභ්‍යකාශ සවාරියේ අවසන් අදියරටයි මේ පැමිණ තිබෙන්නේ.

ඒ තමයි සෞරග්‍රහ මණ්ඩලය පිලිබඳ තොරතුරු ටිකක් දැන ගැනීම.

සෞරග්‍රහ මණ්ඩලයට ග්‍රහලෝක අටක් (8) ඇතුලත් වෙනවා. ඒවා තමයි.

බුද ග්‍රහයා, සිකුරු ග්‍රහයා, පෘථිවිය, අඟහරු, බ්‍රහස්පති, සෙනසුරු, යුරේනස්, නෙප්චූන් කියන ග්‍රහලෝක.

සූර්යා ඒ කියන්නේ ඉර වටේටම තමයි මේ ග්‍රහලෝක පිහිටලා තියෙන්නේ.

ඉර වටේටම මේ ග්‍රහලෝක අට ඉලිප්සාකාරව කැරකෙනවා. ඉතින් යාළුවනේ ඔන්න ඔය විදිහට තමයි අපිට සෞරග්‍රහ මණ්ඩලය හඳුනාගැනීමට හැකිවෙන්නේ.

ඉතින් අපේ මේ අභ්‍යකාශ සවාරියෙන් ඔයාලගේ දැනුමට ගොඩාක් කරුණු එකතු වුනා නේද? එහෙනම් අපේ සවාරිය මෙතනින් නිමා කරමු.

අභ්‍යවකාශය සහ විශ්වය මිනිසා සදහටම විශ්මයට පත් කරන තෝතැන්නකි.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20